# ළමුන් ආරක්ෂා කිරීම සඳහා කඩිනමින් පියවර ගනිමු

■ දරුවන් වෙනුවෙන් සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමට සහ ඔවුන්ගේ දියුණුව සාක්ෂාත් කරගැනීම උදෙසා ඔබේ උපරිම දායකත්වය ලබෙදෙන්න.

■ ළමා අපචාර සහ ලිංගික අපයෝජනය කුමක්ද, එය සිදු වන්නේ කෙසේද, අපයෝජකයෙකු යනු කවුද සහ දරුවෙකු අපයෝජනයෙන් ගලවා ගන්නේ කෙසේද යන්න පිලිබඳව දැනුවත් වන්න.

■ ඔබට ළමා අපයෝජනයක් සම්බන්ධයෙන් දැනගැනීමට ලැබුනහොත් ඒ පිලිබඳව නොපමාව අදාළ බලධාරීන් දැනුවත් කරන්න. ඉතා ඉක්මනින් 1929 හෝ 011 2 44 44 44 අමතන්න.

■ ඔබ අයත් ප්‍රජාවේ අනෙකුත් මාපියන් සමඟ සම්බන්ධ වන්න. අවදානමට ලක්විය හැකි දරුවන් හඳුනාගෙන ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට උදවු කරන්න.

■ ඔබේ ප්‍රදේශයේ සිවිල් සමාජ සංවිධාන/ක්‍රියාකාරීන් විසින් සංවිධානය කරනු ලබන ළමා අපයෝජන වලක්වාගැනීමේ වැඩසටහන් සමඟ සහයෝගිව කටයුතු කරන්න.

■ දරුවන් හට ඔවුන් සුවිශේෂී බවත්, ආරක්ෂිතව සිටීමට අයිතියක් ඇති බවත් උගන්වන්න්, මෙය බොහෝ විට ළමා අපයෝජනයට ලක්වීම තමාගේ වරදක් යයි යන සිතුවිල්ල බැහැර කිරීමට ඔවුන්ට උපකාරී වන අතර එවැනි අපරාධ වාර්තා කිරීමට ඔවුන්ව උනන්දු කරනු ලබයි.

■ දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීමට සෑමවිටම ප්‍රමුඛත්වය ලබා දෙන්න.




ඕනෑම ආකාරයක ළමා අපයෝජනයක් සිදුවන බව ඔබට දැනගැනීමට ලැබුනොත් වහාම ඒ පිලිබඳව පහත සඳහන් දුරකථන අංක වලට දැනුම් දෙන්න;

**PLEASE INFORM:**

■ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 1929
■ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය 011 2 444 444
■ පීස් සංවිධානය 011 281 9397/071 273 3037


info@ecpat.lk
www.ecpat.lk


ECPAT SRI LANKA

PEACE

# දරුවන් සුරක්ෂිත කිරීම සඳහා පීස් සංවිධානය හා එක්වන්න




පරිසරය සහ සෑමතැන වෙසෙන ළමුන් සුරැකීමේ සංවිධානය

# පීස් (PEaCE) සංවිධානය යනු

පීස් (PEaCE) සංවිධානය යනු 1991 වසරේ සිට ක්‍රියාත්මක වන ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධානයකි (NGO).

**ECPAT International** ලෙස හඳුන්වන ආසියානු සංචාරක ව්‍යාපාරයේ තුළ ළමා ගණිකා වෘත්තිය අවසන් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද ගෝලීය ව්‍යාපාරයේ ප්‍රධාන ශ්‍රී ලංකාවේ නියෝජනය ලෙසින් පීස් සංවිධානය ආරම්භ කරන ලදී.

**ECPAT International** ලොව පුරා ළමා ආරක්ෂණ සංවිධානවල ගෝලීය ජාලයක් වේ, එමනිසා බොහෝ විට අප සංවිධානය **PEaCE/ECPAT Sri Lanka** ලෙස ද හැඳින්වේ.

පීස් සංවිධානය සියලු ආකාරයේ සූරාකෑම් සහ අපයෝජනයන්ගෙන් ළමයින් ආරක්ෂා කරන අතර ඔවුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය



පීස් සංවිධානය සියලු ආකාරයේ සූරාකෑම් සහ අපයෝජනයන්ගෙන් ළමයින් ආරක්ෂා කරන අතර ඔවුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරයි.

ප්‍රධාන වශයෙන්ම ළමා අපයෝජන සහ ලිංගික සූරාකෑම වැළැක්වීම සඳහා පීස් සංවිධානය විසින් රට පුරා විවිධ වැඩසටහන් පවත්වනු පවත්වනු ලබයි.

තවද පීස් සංවිධානය දරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම උදෙසා රාජ්‍ය අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ළමා ආරක්ෂණ ආයතන, සිවිල් සමාජ සංවිධාන සහ අනෙකුත් ආයතන සමඟ සමීපව සම්බන්ධ කටයුතු කරනු ලබයි.

# පීස් (PEaCE) සංවිධානය මූලික වශයෙන් පහත සඳහන් ක්ෂේත්‍ර හතර

## දැනුවත් කිරීම

පීස් (PEaCE) සංවිධානය මගින් ළමුන්, දෙමාපියන්, ගුරුවරුන්, තරුණයින්, සිවිල් සමාජ සංවිධාන, ළමා සංවර්ධන කමිටු සාමාජිකයින්, නීතිය ක්‍රියාත්මක කරන ආයතන, රජයේ ළමා ආරක්ෂණ ආයතන, වෙනත් රාජ්‍ය ආයතන, නීති අංශය, සංචාර සහ සංචාරක අංශය, තොරතුරු තාක්ෂණ අංශය සහ අනෙකුත් සිවිල් සංවිධාන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි.

## පුහුණු කිරීම සහ ධාරිතා සංවර්ධනය

ළමා අයිතිවාසිකම්, ළමා ලිංගික සූරාකෑම, සංචාරක සහ සංචාරක ව්‍යාපාරය තුළ සිදුවන ළමා ලිංගික සූරාකෑම, අන්තර්ජාලය ඔස්සේ සිදුවන ළමා ලිංගික සූරාකෑම සහ අපයෝජනය සහ වින්දිතයින් හඳුනාගැනීම පිළිබඳව පුහුණුව සපයයි.







## පර්යේෂණ පැවැත්වීම

**PEaCE** සංවිධානය විසින් ළමා අපයෝජන ව්‍යාප්තිය වඩා හොඳින් අවබෝධ කර ගැනීමට සහ ඒ හා සම්බන්ධ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීමටත්, විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා දීම සඳහාත් සාක්ෂි පදනම් කරගත් පර්යේෂණ පවත්වයි, එය වඩාත් ඵලදායී වැඩසටහන් සහ පහසුකම් සැලසුම් කිරීමටත් උපකාරී වේ තවද, නීති සහ නෛතික ක්‍රියා පටිපාටිවල වෙනස්කම් සිදුකිරීමට මෙම පර්යේෂණ බලපෑම් කරනු ලබයි.

## උද්දේශනය

ළමුන් උදෙසා වූ අපගේ දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් සෑම අවස්ථාවකදීම දරුවන්ගේ හඬ ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සහ සහතික කිරීම අරමුණු කරයි.

**UN** ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව **(Committee on the Rights of the Child)** වැනි කලාපීය සහ ජාත්‍යන්තර ජාල සහ ආධාරක කණ්ඩායම් සමඟ සහයෝගයෙන් අප සංවිධානය කටයුතු කරනු ලබයි.

ළමා ලිංගික සූරාකෑම සහ අපයෝජනයට එරෙහිව විවිධ පුද්ගලයින්, ප්‍රජාවන්, ආයතනික අංශ සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර කතිකාවතක් ගොඩනැගීම සහ එවැනි වැරදි